# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 7 ශ්‍රේණිය

## නර්තනය                    කාලය : පැ 02

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) නර්තනයේ මූලික අංගහාරය

i) මණ්ඩියයි.
iii) නමස්කාරයයි.
ii) පා සරඹයයි
iv) මාත්‍රයයි.

(2) මණ්ඩිය අතර දුර ප්‍රමාණය වන්නේ
i) අඩියයි
iii) රියනයි
ii) මිටිරියනයි
iv) අඟල් 12 යි.

(3) තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම් මෙය
i) 1 පාසරඹයයි
iii) 2 පාසරඹයයි
ii) 4 පාසරඹයයි
iv) මණ්ඩියයි

(4) කමතේ දී බැත එකතු කිරීම - බැත හුලං කිරීම - වී පෙළීම ආදී කටයුතු නිරූපණය කෙරෙනුයේ
i) කුලු
iii) පන් නෙළීම
ii) ගොයම් කැපීම
iv) කළගෙඩි

(5) සෙලවීමෙන් හා පිඹීමෙන් ශබ්ද උපදවා ගතහැකි විකල්ප උපකරණයකි.
i) මදටිය ඇට දැමූ ප්ලාස්ටික් බෝතලය - පැපොල් බට නලාව
ii) පැපොල් බටනලාව - වතුර පුරවන ලද බෝතලය
iii) ලීයක් සවිකළ පොල්කටු 02ක් සහ බැලුම් බෝලය
iv) ගල්කැට දැමූ වීදුරු බෝතලය - ටොනික් පියන් වළල්ල

(6) දවුල් බෙරයේ සම්මත දිග
i) අඟල' 18 කි.
iii) අඟල් 12කි.
ii) අඟල් 10කි.
iv) අඟල් 15කි.

(7) 2 3 දෙතිත තාල රූපය ………………………. නමින්ද හැඳින්වේ
i) සුළු මැදුම් දෙතිත
iii) මැදුම් මහ දෙතිත
ii) මැදුම් තනිතිත
iv) මහ තනි තිත

(8) පහතරට නර්තනය ප්‍රගුණ කළ ආධුනිකයෙකු ඔහුගේ ශිල්ප දැකවීමේ ප්‍රථම අවස්ථාව හඳුන්වන්නේ,
i) කළඑළි බැසීම
iii) ගුරු වරම් දීම
ii) මඩුබැසීම
iv) හලං මැඩවීම

(9) රාමසාන් උත්සවයෙන් අවසන් කරනු ලබන උපවාස ශීලය ආරම්භ කරනු ලබන්නේ,
i) මැයි මාසයේය.
iii) ජූලි මාසයේය.
ii) ජුනි මාසයේය.
iv) අගෝස්තු මාසයේය.

(10) ශාන්තිකර්ම සැරසිලි සඳහා බහුලව භාවිතා කරනු ලබන්නේ
i) ලී කෝටු - නාගවල්ලි කොළ
iii) පොල් කොළ - අඹ කොළ
ii) ගොප් කොළ - කෙසෙල් බඩ
iv) ඉරටු, ලී කෝටු

- 11 - 15 දක්වා ප්‍රශ්නවලට හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

(11) රන්තෙලඹු වර්ණනාවේ කවි කුළු නැටුම සඳහා යොදා ගනී. ( )

(12) දෙවොල් මඩුව උඩරට සම්ප්‍රදායට අයත්වේ. ( )

(13) කුඳ ගත ගත දොං මාත්‍රා 3 3 ට අයත් බෙර පදයකි. ( )

(14) පහතරට බෙරය සම්ප්‍රදායිකවාද්‍ය භාණ්ඩයකි. ( )

(15) පා සරඹ සබරගමු සම්ප්‍රදායේදී මණ්ඩි පද ලෙස හැඳින්වේ. ( )

- 16 - 20 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යා කරන්න.

| | |
|---|---|
| (16) තත් ජිත් තොං නං තා | තාලම් නැටුම |
| (17) රාමසාන් උත්සවය | සුළඟ |
| (18) උඩරට නර්තන සම්ප්‍රදාය | කස්තිරමකි. |
| (19) වැසි දිනයක දැකිය හැකි ලක්ෂණයකි. | අල්ලාහ් දෙවි |
| (20) තාලම්පට අගට ගෙන රඟනු ලබන්නේ | වෙස් ඇඳුම් කට්ටලය |

(ල. 20 x 2 = 40 )

**11 කොටස**

- **ප්‍රශ්න 04 ක් තෝරා පිළිතුරු සයන්න.**

(1)

i) සුළු තනි තිතට අයත් බෙර පදයක් ලියන්න. (ල 04)
ii) තුරඟා වන්නමේ කවියක් ලියන්න. (ල 04)
iii) කුළු නැටුමට අයත් පද දෙකක් අදාළ තිත් රූපයට ප්‍රස්තාර නරන්න. (ල 07)

(2)

i) දවුල වාදනය කරන අවස්ථා 03 ක් ලියන්න. (ල 04)
ii) දවුල සෑදීමට ගන්නා අමු ද්‍රව්‍ය 03 ක නම් ලියන්න. (ල 04)
iii) දවුලෙහි රූප සටහනක් ඇඳ කොටස් තුනක් නම් කරන්න. (ල 07)

ʼග

i) විකල්ප වාද්‍ය උපකරණ 04 ක් ලියන්න. (ල 04)
ii) විකල්ප වාද්‍ය උපකරණ යොදාගෙන කළ හැකි වාදන අවස්ථා 02ක් ලියන්න. (ල 04)
iii) ඔබ කැමති වාද්‍ය උපකරණයක රූප සටහනක් ඇඳ එය සාදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ල 07)

(3)

i) ගැමි නැටුම් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ල 04)
ii) ගැමි නැටුම් වර්ග 04 ක නම් ලියන්න. (ල 04)
iii) තාලම් සහ කුලු කවියක් ලියා දක්වන්න. (ල 07)

(4)

i) රාමසාන් උත්සවය පැවැත්වීමේ හේතු02 ක් ලියන්න. (ල 04)
ii) රාමසාන් උත්සවය තුලින් සමාජයට ගතහැකි ආදර්ශය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 04)
iii) රාමසාන් උත්සවයේ පිළිපදින චාරිත්‍ර 02 ක් ලියන්න. (ල 07)

(5)

i) වැස්සට පෙර පරිසරයේ සිදුවන වෙනස්කම් 03 ක් සඳහන් කරන්න. (ල 04)
ii) වැසි දිනකදී පරිසරයේ සිදුවන වෙනස් කම් 03 ක් ලියන්න. (ල 04)
iii) වැස්ස ගැන කියවෙන ගීතයක කොටසක් ලියා දක්වන්න. (ල 07)